www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තායිලන්තයෙහි පන්ති අරගලය

## The class struggle in Thailand

**2010 අප්‍රේල් 15**

පසු ගිය සෙනසුරාදා කැරලි මර්දන සන්නද්ධ හමුදා භටයන් විසින් තායි අග නගරයෙහි පිහිටුවා ගෙන තිබුනු විරෝධතාකරුවන්ගේ කඳවුරු දෙකෙන් එකක් බිඳ දැමීමට ප්‍රයත්න දැරීමේදී හට ගත් වීදි සටන් සමග සති ගනනාවක් තිස්සේ බැංකොක්හි පැවතුනු ආන්ඩු විරෝධී උද්ඝෝෂන වඩාත් තීව්‍ර විය. සටන් නිසා ඇති වුනු මරන සංඛ්‍යාව මේ වන විට 23 දක්වා ඉහල නැග ඇත. ඉන් 18 දෙනෙකු සිවිල් වැසියෝ වන අතර 5 දෙනෙකු සොල්දාදුවෝ ය. විරෝධතාකරුවන් දහස් ගනනක් සිය කඳවුරු බිම හැර නොයා සිටි තතු යටතේ දෙපාර්ශ්වයේ ම සිය ගනනක් තුවාල ලදහ. අන්තිමේ දී, හමුදා භටයන්ට පසු බැසීමට සිදු විය.

තායිලන්තය තුල පුපුරා ගොස් ඇත්තේ කලාපය පුරාත් ජාත්‍යන්තරවත් කම්කරුවන්ට පුලුල් අර්ථභාරයක් සහිත පන්ති අරගලයක බලගතු පලමු අදියර යි. පසු ගිය සිව් වසර තිස්සේ තායි පාලක ප්‍රභූවේ කොටස් අතර පවතින කටුක අභ්‍යන්තර දේශපාලන ගැටුම් නිසා ග්‍රාමීය සහ නාගරික දුප්පතුන්ට දේශපාලන කරලියට පිවිසීමට දොරටු විවර වී තිබේ. හදිසි මැතිවරනයක් සඳහා කල කැඳවුමත් සමග දරිද්‍රතාව සහ විරැකියාව සම්බන්ධයෙන් බරපතල සමාජීය උත්සුකතා පැන නගින්නට පටන් ගෙන ඇත.

තායිලන්ත සහ ජාත්‍යන්තර මාධ්‍ය සංස්ථාපිතයට පන්ති බෙදුම්කඩනය ගැන අදහස් දක්වන්නට බල කෙරී ඇතිබව ඉතා පැහැදිලි ය. "රතු කමිස" විරෝධතා සිදු වන්නේ සමාන පුද්ගලයන්ගේ එකතුවෙන් නො වේ. බිලියනපති ව්‍යාපාරිකයෙකු ද බලයෙන් පහ කෙරුනු අගමැති ද වන තක්සින් ශිනවත්‍රාගේ පිටුබලය සහිතව සිදු වන එම විරෝධතාවලට සහභාගි වී සිටින විරෝධතාකරුවන්ගෙන් අතිමහත් බහුතරය උකහා ගැනුනේ රටෙහි වඩා දිලිඳු ග්‍රාමීය ප්‍රදේශවලිනි. උද්ඝෝෂන සිදු වී ගෙන යද්දී කම්කරුවෝ ද නාගරික දුප්පත්තු ද ඒවාට එක් වූහ. හමුදා ප්‍රධානීන් විශේෂයෙන් ම අපහසුවට පත්ව සිටින්නේ යට කී සමාජ තට්ටුවලින් හමුදාවට උකහා ගනු ලැබ එහි වඩා පහල ශ්‍රේනිවල සේවය කරන සාමාජිකයන් අතර විරෝධතාකරුවන් සම්බන්ධයෙන් සානුකම්පික හැඟීමක් හට ගෙන ඇති බවට  ඉතා පැහැදිලි ලකුනු පවතින බැවිනි.

අග නගරයෙහි පිහිටි වරප්‍රසාදිත සාප්පු සංකීර්න සහ තරු පහේ හෝටල් මධ්‍යයෙහි රතු කමිස හැඳි ගම්මුන් කඳවුරු පිහිටුවා ගෙන සිටින කාන්තිමත් රට්චැප්රසොන්ග් වානිජ දිස්ත්‍රික්කයේ දී සමාජීය බෙදුම්කඩනයන් විශේෂයෙන් ම පැහැදිලිව දැක ගත හැකි ය. දිනකට බාත් 100ක් හෙවත් එක්සත් ජනපද ඩොලර් 3ක් උපයන සුපාවදී බම්හයින්ග් ගම්බද ප්‍රදේශයකින් පැමිනි පලතුරු වෙලෙන්දියකි. සිඩ්නි මෝනිං හෙරල්ඩ් පුවත්පතට කතා කරමින් ඇය කියා සිටියේ තමා අතීතයේ දී දරිද්‍රතාව ඉවසා සිටි බව යි. ඒත් "දැං ඒ විදියට ඉන්න බැහැ" යි ඈ කීවා ය. "ඒ ගොල්ලෝ හැම දා ම පොහොසත්, අප හැම දා ම දුප්පත්. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ඒක නෙවෙයි."

මෙම අදහස් දැක්වීම තුල ගැබ්ව තිබෙන්නේ පොහොසතුන් සහ දුප්පතුන් අතර පුලුල් වෙමින් පවතින දැවැන්ත පරතරය ගැන වැඩ කරන ජනතාවගේ පලල් කොටස් අතර පැන නැග ඇති නොමනාපය සහ කෝපය යි. ගෝලීය ආර්ථික අර්බුදය හේතු කොට ගෙන බහුතර ජනගහනය දැවැන්ත දුෂ්කරතාවලට මුහුන දෙද්දී ඉතා කුඩා ප්‍රභූවකට අයත් අප්‍රමාන ධනයක් ගොඩ ගසා ගත් පොහොසත්තු අඛන්ඩව සිය ධනස්කන්ධය වැඩි කර ගනිමින් සිටිති. එමෙන් ම, දිලිඳු භාවයට පත් ගම්මුන්ගේ "ප්‍රජාතන්ත්‍රවාදය" තක්සින්ගේ සහ නව මැතිවරනයක් සඳහා විරෝධතා ව්‍යාපාරයේ නායකයන්ගේ ආකාරගත ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීම්වලින් බෙහෙවින් ඔබ්බට ගමන් කරයි. ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ අදහසට නිසි ජීවන තත්ත්වයක් හිමි කර ගැනීම සඳහා පවතින මූලික සමාජීය අයිතිය ද ඇතුලත්

තායිලන්තය ආසියාවෙහි සාමාජීය අසමානතාව වැඩි ම රටවලින් එකකි. තායිලන්ත බැංකුව නිකුත් කල වාර්තාවකට අනුව, ජනගහනයේ ඉහල ම සියයට 20 ජාතික ධනයෙන් සියයට 69ක් ම පාලනය කරයි. එහෙත් පහල ම සියයට 20 පාලනය කරන්නේ ජාතික ධනයෙන් සියයට 1කි. පහල ම සියයට 20 සාමාන්‍ය ආදායම මසකට බාත් 1,443ක් හෙවත් එක්සත් ජනපද ඩොලර් 45කි. එනම්, නිල දරිද්‍රතා මට්ටමට සමාන ය. පසු ගිය වසරෙහි ආර්ථිකය සියයට 3.5කින් සහ නය ගැනීමේ පහසුකම් හැකිලීයද්දී බරපතල ම පහර එල්ල

වූයේ කම්කරු පන්තියට සහ සුලු පරිමාන ගොවීන්ට, ව්‍යාපාරිකයන්ට සහ වෙලඳුන්ට ය. මෙම වසරෙහි ආර්ථික වර්ධනය යලි ඇරඹී කොටස් මිල ගනන් ද ඉහල ගිය මුත් ඉන් වැඩ කරන ජනයා මුහුන දෙන අගහිඟකම්වල අඩු වීමක් සිදු වී නැත.

බැංකොක්හි පුපුරා ගොස් ඇති සමාජීය ආතතීන් වූකලී කලාපය පුරාත් ගෝලීය පරිමානවත් පුපුරා යාමට නියමිත පන්ති අරගල පිලිබඳ පෙරනිමිත්තකි. සමපේක්ෂන ද ලාභ ශ්‍රමය සූරා කෑම ද හරහා ධනවත් වුනු කුඩා සුලුතරයක අත්‍යධික ඉසුරුමත් භාවය විදහා දැක්වෙන්නේ බැංකොක් අග නගරයෙහි පමනක් නො වේ, ආසියාව පුරා පිහිටි ප්‍රධාන නගරවල එය දැක ගත හැකි ය. කෝටි සංඛ්‍යාත කම්කරුවන්ගේ කර පිටින් අතලොස්සක් දෙනා අප්‍රමාන සමෘද්ධිමත් භාවයක් ලඟා කර ගෙන සිටින චීනයෙහි සහ ඉන්දියාවෙහි හට ගෙන ඇති සාමාජීය බෙදුම්කඩනයන්ගෙන් නොවැලැක්විය හැකි ලෙස ම පුපුරනසුලු සාමාජීය ප්‍රතිවිපාක ජනනය වනු ඇත.

තායිලන්තයෙහි පැන නැග ඇති විරෝධතාවලින් රට තුල පවතින විරාගත දේශපාලන ගැටලු ද පෙන්නුම් කරයි. නියත හැඩයක් නොගත් ආන්ඩු විරෝධී ව්‍යාපාරයේ ආධිපත්‍යය දරා සිටින්නේ තායි ප්‍රභූවේ කොටසක ආර්ථික සහ දේශපාලනික ඕනෑඑපාකම් තව දුරටත් වර්ධනය කර ගැනීම සඳහා විරෝධතාවයන් ගසා කමින් සිටින තක්සින්ගේ පිටුබලය සහිත ආඥාදායකත්වයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා එක්සත් පෙරමුන (යූඩීඩී) යි. 2001 සහ 2006 අතරතුර කාලය තුල බලයෙහි සිටිය දී තක්සින් ද සිය විරුද්ධවාදීන් සේ ම ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහිව නිර්දය ලෙස ක්‍රියා කිරීමට සූදානමින් සිටියේ ය. ඔහු දුප්පතුන්ට දුන් සීමිත දීමනාවල මූලික එල්ලය වූයේ 1997-98 ආසියානු ආර්ථික අර්බුදය නිසා බිඳ වැටුනු ආර්ථිකය දිරි ගැන්වීම සහ තායි ව්‍යාපාර යලි පන ගැන්වීම යි. කෙසේ වුව ද, ඔහුගේ ආර්ථික න්‍යාය පත්‍රය නිසා රට තුල දිගු කලක් තිස්සේ ස්ථාපිතව තිබුනු අනුග්‍රාහකාත්මක පද්ධතිවලට පහර වැදුන අතර රටේ සාම්ප්‍රදායික ප්‍රභූව — එනම් හමුදාව, රාජ්‍ය නිලධරය සහ රාජාන්ඩුව — දුරස්ත විය.

සමාජ අසාධාරනත්වය පිලිබඳ ප්‍රාරම්භක හැඟීම්වලින් මෙහෙයවන ලද ආන්ඩු විරෝධී විරෝධතාකරුවෝ අධිෂ්ඨාන සහගතව ද ධෛර්ය සම්පන්නව ද සටන් වැදී ඇත. එහෙත් සුපැහැදිලි යථාර්ථය නම් මෙම නාගරික සහ ග්‍රාමීය දුප්පතුන් යූඩීඩී නායකත්වය යටතේ සිටිය හොත් ඔවුන් පාවා දීමට ලක් වනු ඇත. ගිය අප්‍රේල් මාසයෙහි බැංකොක්හි දී ආන්ඩු විරෝධී විරෝධතාකරුවන් සහ හමුදා භටයන් අතර හට ගත් උග්‍ර ගැටුම්වල ප්‍රතිඵලය යලි සිහිපත් කිරීම ම මෙහි ලා ප්‍රමානවත් ය. උද්ඝෝෂන සිය පාලනයෙන් ගිලිහී යන බව පෙනෙන්නට පටන් ගත් වහා ම තක්සින් සහ යූඩීඩීය එම ව්‍යාපාරය නවතා දැමී ය.

මෙම සිද්ධිය ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ මූලික මතවාද තවදුරටත් සනාත වීමකි. එනම්, තායිලන්තය වැනි කල් පසු වූ ධනවාදී වර්ධනයක් සහිත රටවල ධනේශ්වරයේ කවර හෝ කොටසක් වැඩ කරන ජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අපේක්ෂාවන් ද සමාජීය අවශ්‍යතාවන් ද සපුරා ලීමට ඓන්ද්‍රීයව ම අසමත් ය. සමාජවාදී පිලිවෙත් මත පදනම් වුනු කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ ආන්ඩුවක් උදෙසා අරගලයට ග්‍රාමීය මහජනතාව පුබුදුවා ගත හැකි අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ කෘෂිකාර්මික ප්‍රතිසංස්කරන සඳහා සටන් වැදීමට සමත් වන්නේ කම්කරු පන්තිය පමනකි.

පසු ගිය දශක තුන තිස්සේ, තායිලන්තයෙහි කම්කරු පන්තිය ප්‍රමානය අතින් ද සංකීර්නතාව අතින් ද අතිමහත් ලෙස පුලුල් වී ඇත. තායිලන්තය දැන් ලෝකයේ දස වන විශාලතම මෝටර් රථ අපනයනකරුවා යි. එම කර්මාන්තයෙහි පමනක් මිලියන භාගයකට ආසන්න කම්කරුවෝ සේවයෙහි නියුක්තව සිටිති. කෙසේ වුව ද, වත්මන් දේශපාලන නැගිටීම තුල කම්කරු පන්තිය තව මත් දැනෙන අයුරින් සහභාගි වී නැත. යූඩීඩී විරෝධතාවලට සහ රැලිවලට කම්කරුවන් සම්බන්ධ වී සිටින්නේ පුද්ගලයන් හැටියට මිස පන්ති සංවිධාන ලෙස නො වේ.

ලොව පුරා සිටින එහි සමපාර්ශවකරුවන්ට මෙන් ම තායිලන්තයෙහි කම්කරු පන්තියට ද සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ක්‍රියා මාර්ගයක පදනම මත සිය පන්ති අවශ්‍යතා නියෝජනය කරන තමන්ගේ ම මහජන දේශපාලන පක්ෂයක් නැත. සීමාසහිත ක්‍රියා මාර්ගයක් මත පදනම් වූ වෘත්තීය සමිති නොවැලැක්විය හැකි ලෙස ම ක්‍රියාත්මක වන්නේ ආන්ඩුවේ සහ සංගත ප්‍රභූවේ මෙවලම් ලෙස ය. ග්‍රාමීය ගරිල්ලාවාදයේ බංකොලොත් මාඕවාදී ඉදිරි දර්ශනය මත පදනම් වුනු තායිලන්ත ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය දශක තුනකට පෙර තමන් විසින් ම දිය වී ගියේ ය. 1970 ගනන්වල දේශපාලන සටන් හරහා පැමිනි හිටපු ශිෂ්‍ය රැඩිකලුන් පාලක පන්තියේ තක්සින් හිතවාදී සහ තක්සින් විරෝධී කඳවුරු සමග එක් වී ඇත.

තමන්ගේ ම දේශපාලනික හඬ නංවමින්, ධනපති පන්තියේ සියලු කොටස්වලින් ස්වාධීනව මතු වී එන්නට පටන් නොගත හොත් කම්කරු පන්තිය දැවැන්ත අන්තරායන්ට මුහුන දෙයි. පසු ගිය සෙනසුරාදාවේ හට ගත් ගැටුම් අද්දර දී, මිලිටරි කුමන්ත්‍රනයක් කිරීමේ අවශ්‍යතාව ගැනත් වීදිවල සාමය යලි ඇති කිරීම සඳහා යුද ටැංකි සහ හමුදා භටයන්

මුදා හැරීමේ අවශ්‍යතාව ගැනත් පාලක කව තුල විවෘත සාකච්ඡා සිදු විය. මෙම පියවරයන්ට ගාමක බලය සැපයෙන්නේ අඛන්ඩ අස්ථාවරත්වයකින් ද අර්බුදයකින් ද යුතු ගෝලීය ආර්ථික වාතාවරනයක් මධ්‍යයේ කොටස් වෙලඳ පොලෙහි සිදු වන දරුනු ඇද වැටීම්වලින් සහ සංචාරක කර්මාන්තයෙහි සිදු විය හැකිව තිබෙන විනාශයෙනි.

ඉදිරි මාවත වැටී ඇත්තේ කම්කරු පන්තියේ ඓතිහාසික අවශ්‍යතා නියෝජනය කරන දේශපාලන පක්ෂයක් ගොඩ නැගීම තුල ය. ඒ සඳහා අවශ්‍ය කරන සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී ක්‍රියා මාර්ගය සහ ඉදිරි දර්ශනය සපයා ගත යුත්තේ ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය — හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව — ස්ටැලින්වාදයට සහ අවස්ථාවාදයේ සියලු රූපාකාරයන්ට එරෙහිව ගෙන ගිය දිග් ගැසුනු අරගලය තුලිනි. තායිලන්තය තුල හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවක් ගොඩ නැගීම සඳහා පදනම දැමීමට නම් කම්කරුවන් සහ තරුනයන් මෙම කටයුත්තට යොමු විය යුතුය.

පීටර් සිමන්ඩ්ස්

© www.wsws.org